රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

## 2024-12-09 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව ස්ථාපිත කිරීම

ජාතික ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව ඇති කිරීම සහ ආහාර ආරක්ෂිතව ලබා දීම රජයේ ප්‍රමුඛ කාර්යයක් වන අතර, සෑම පුරවැසියෙකුගේම අවම ආහාර අවශ්‍යතාව ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව දැරිය හැකි මිලකට ලබා දීම රජයේ ප්‍රධාන අරමුණකි. නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් ඒ සඳහා ක්‍රියාමාර්ග රැසක් යෝජනා කර ඇති අතර, රට තුළ නිෂ්පාදනය කළ හැකි සියලුම ආහාර දේශීයව නිෂ්පාදනය කිරීම, අවම වශයෙන් මාස 03කට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වාගැනීම, රටේ පවතින ආහාර තොග පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම සහ ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඉවහල් වන නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදා හැරීම, තොග හා සිල්ලර වෙළෙඳාම යන ක්‍රියාවලින් සඳහා පෞද්ගලික අංශයේ ද සහභාගිත්වය ලබා ගනිමින් ඵලදායී වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම ඒ අතුරින් ප්‍රමුඛ කාර්යයන් වශයෙන් හඳුනාගනු ලැබ ඇත. එම කාර්යයන් සඳහා ඉහළ අවධානයක් යොමු කිරීම මෙන්ම ආයතනික සම්බන්ධීකරණය කාර්යක්ෂම කිරීම සඳහා ජාතික ආහාර හා පෝෂණ සුරක්ෂිතතා සහ ආරක්ෂිතතා වැඩසටහන ජනාධිපති කාර්යාලය මඟින් සම්බන්ධීකරණය කිරීමට තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා සම්බන්ධිත සියලුම ආයතනයන්හි සහභාගිත්වය සහිත, දත්ත හා තොරතුරු මත පදනම් වූ විද්‍යාත්මක විශ්ලේෂණයන් තුළින් ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමාගේ සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන ඇමතිතුමාගේ සම සභාපතිත්වයෙන් සහ අග්‍රාමාත්‍ය ලේකම් ඇතුළු අනෙකුත් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සාමාජිකත්වයෙන් යුතුව "ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව" ජනාධිපති කාර්යාලය යටතේ ස්ථාපිත කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

**02. බලශක්ති පද්ධතිය ශක්තිමත් කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් අරමුදල් සලසා ගැනීම**

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ විදුලි සම්ප්‍රේෂණ ජාලය ශක්තිමත් කිරීම සහ නවීකරණය කිරීම සඳහා හඳුනාගනු ලැබ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කිරීම සඳහා 2024-09-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, භාණ්ඩාගාර ඇපකරයක් මත වෙන් වෙන් වශයෙන් ණය ගිවිසුම් 02ක් යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම වෙත පිළිවෙලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 150ක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක් වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක ණය මුදලක් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, එකී ණය මුදල ලබා ගැනීම සඳහා වන ඇපකර ගිවිසුමකට ආසියානු සංවර්ධන බැංකුව සමඟ අත්සන් තැබීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. සීමාසහිත සිනෝර් පදනමට අයත්, කරෙයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම**

සීමාසහිත සිනෝර් පදනමට අයත් කරෙයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අවසන් කිරීම සහ අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා කාර්යාලයීය උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට ඉන්දීය රජය විසින් එකඟතාව පළ කර ඇති අතර, ඒ සඳහා වන අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස 2024-10-21 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එකී අවබෝධතා ගිවිසුමට මෙතෙක් අත්සන් තබා නොමැති අතර ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, දෙපාර්ශ්වය අතර එම ගිවිසුමට අත්සන් තැබීමටත්, යෝජිත මූල්‍ය ප්‍රදානය කරෙයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා යොදා ගැනීමටත් නව අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

**04. ආර්ථික අර්බුදය හේතු කොට ගෙන ධීවර කර්මාන්තයට ඇතිවී ඇති බලපෑම අවම කර, ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ වැඩසටහන - 2024**

ආර්ථික අර්බුදය හේතු කොට ගෙන ධීවර කර්මාන්තයට ඇති වී ඇති බලපෑම අවම කර, ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණින් 2024-10-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06ක කාලසීමාවක් සඳහා ඉන්ධන වශයෙන් ඩීසල් භාවිත කරන ධීවර යාත්‍රා හිමිකරුවන්ට ඩීසල් ලීටරයකට රුපියල් 25/-ක් බැගින් සහ ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිත කරන ධීවරයින්ට දිනකට භූමිතෙල් ලීටර 15ක් බැගින් මාසික උපරිම දින 25ක් සඳහා භූමිතෙල් ලීටරයකට රුපියල් 25/- බැගින් "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ දීමනාවක්" ලබා දීමට 2024-08-21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය දී ඇත. ඒ අනුව, ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිත කරන කුඩා යාත්‍රාවලට අදාළව මෙම සහනය ලබා දීම වඩාත් සරල කිරීමේ අරමුණින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සක්‍රීය කුඩා ධීවර යාත්‍රා සඳහා අදාළ ධීවර යාත්‍රා හිමියන්ට මාසිකව රුපියල් 9,375/-ක "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ දීමනාවක්" 2024-11-01 දින සිට මාස 05ක කාලයක් සඳහා ලබා දීමටත්, ඩීසල් යාත්‍රා හිමිකරුවන් සඳහා දැනට ලබා දෙන සහනය පෙර පරිදිම ලබා දීමටත් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. තෙත්බිම් සම්බන්ධ අන්තර්ජාතික රැම්සාර් සම්මුතියේ පාර්ශ්වකරුවන්ගේ සම්මේලනයට ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කිරීමට නියමිත යෝජනාව**

තෙත්බිම් සම්බන්ධ අන්තර්ජාතික සම්මුතිය හෙවත් රැම්සාර් සම්මුතියේ 15 වන පාර්ශ්වකරුවන්ගේ සම්මේලනය 2025 ජූලි මාසයේ සිම්බාබ්වේදී පැවැත්වීමට නියමිතව ඇත. එම සම්මේලනය සඳහා ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාව විසින් "තෙත්බිම්වල ස්වභාවධර්මයේ හිමිකම්" සම්බන්ධ යෝජනාවක් කෙටුම්පත් කර ඇත. එම යෝජනාව මඟින් සාමාජික රටවල් විසින් සිය රටවල පවතින තෙත්බිම්වල ස්වභාවධර්මයේ හිමිකම හඳුනා ගැනීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, එකී යෝජනාව ශ්‍රී ලංකාව විසින් රැම්සාර් සම්මුතියේ 15 වන පාර්ශ්වකරුවන්ගේ සම්මේලනය වෙත ඉදිරිපත් කිරීම පිණිස පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. හොරණ අපනයන සැකසුම් කලාපයේ පොදු අපජල පිරිපහදු යන්ත්‍රාගාරය වැඩිදියුණු කිරීම**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අරමුදල් භාවිතයෙන් හොරණ අපනයන සැකසුම් කලාපයේ පොදු අපජල පිරිපහදු යන්ත්‍රාගාරයේ ධාරිතාව වැඩි කිරීම පිණිස 2023-06-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ සඳහා ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇති අතර, ලංසු 11ක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත හොරණ අපනයන සැකසුම් කලාපයේ පොදු අපජල පිරිපහදු යන්ත්‍රාගාරයේ ධාරිතාව වැඩි කිරීමේ කොන්ත්‍රාත්තුව Luminex PLC වෙත පිරිනැමීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ALCO ඩීසල් එන්ජින් 22ක් ඉන්දියානු රජයේ ප්‍රදානයක් ලෙස ලබාගැනීම**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා සුළු වශයෙන් භාවිතා කරන ලද M10 දුම්රිය එන්ජින් මාදිලියේ වැඩිදියුණු කළ එන්ජින් 20ක් හා එම එන්ජින් නඩත්තුවට අවශ්‍ය අමතර කොටස් ලබා ගැනීම පිණිස අතිරේක දුම්රිය එන්ජින් 02ක් ප්‍රදානයක් ලෙස ලබා දීමට ඉන්දීය දුම්රිය සේවය කැමැත්ත පළ කර ඇත. එකී දුම්රිය එන්ජින් නඩත්තු කිරීමේ සේවාව වසර 05ක කාලයකට ලබා දීම සඳහා වන නොකැඳවූ යෝජනාවක් ඉන්දියාවේ ඉංජිනේරු උපදේශක සහ යටිතල පහසුකම් සංවර්ධන සමාගමක් වන RITES සමාගම විසින් ඉදිරිපත් කර තිබේ. එම යෝජනාව ඇගයීමට ලක් කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවක් සහ ව්‍යාපෘති කමිටුවක් පත් කිරීමට 2024-06-11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ප්‍රදානයක් වශයෙන් ලබා දෙන අදාළ දුම්රිය එන්ජින් නඩත්තු කිරීමේ හැකියාව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතුව පවතින බවත්, එකී දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය මඟින් එම කාර්ය ඉටුකරවා ගැනීම යෝග්‍ය බවත් ව්‍යාපෘති කමිටුව විසින් පෙන්වා දී ඇත. ඒ අනුව, ප්‍රථම කොට අදාළ ප්‍රදාන ගිවිසුමට අත්සන් තබා දුම්රිය එන්ජින් 22ක ප්‍රදානය ශ්‍රී ලංකා රජය විසින් පිළිගැනීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 08. නව ඩිජිටල් රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම

මේ වන විට සුහුරු කාඩ්පතක් ලෙස රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම ආරම්භ කර වසර 15කට ආසන්න කාලයක් ගත වී ඇති අතර, අදාළ ආයතන අතර දත්ත හුවමාරුවකට පහසුකම් සලසමින් නව තාක්ෂණය අනුව ලෝකයේ රටවල් ගණනාවක දැනට භාවිත කරනු ලබන ඩිජිටල් රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීමේ යෝග්‍යතාව රජය විසින් හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනා සැලකිල්ලට ගෙන, දැනට භාවිත කරනු ලබන රියදුරු බලපත්‍රය වෙනුවට නව ඩිජිටල් රියදුරු බලපත්‍රයක් කඩිනමින් හඳුන්වා දීම පිණිස අවශ්‍ය පියවර ගැනීමටත්, එතෙක් රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය තවදුරටත් ක්‍රියාත්මක කිරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

### 09. පූගොඩ අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සහ මිල විචලනයන් සඳහා වන ගෙවීම් කිරීම

පූගොඩ අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වන ඉදිකිරීම් සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) මිල විචලනයන්ට අදාළ සූත්‍ර භාවිතයෙන් ගණනය කරනු ලබන සත්‍ය මිල විචලනයන් එවකට අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් සමාලෝචනය කිරීමෙන් අනතුරුව, එකී කමිටුවේ නිර්දේශ මත පදනම්ව ගෙවීම සඳහා 2023-11-13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියේ උපදේශක සේවා සහ ඉදිකිරීම් පවරනු ලැබ ඇති ආයතනය වන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති මිල විචලනයන් සම්බන්ධයෙන් වන වාර්තාව එම අමාත්‍යාංශයේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් සමාලෝචනය කර තිබේ. ඒ අනුව, පූගොඩ අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 681.2ක් ලෙස සංශෝධනය කර අදාළ මිල විචලනයන් ගෙවීමටත්, ව්‍යාපෘතියෙහි ඉතිරි වැඩ නිම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කර ගැනීමටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත (Proceeds of Crime Bill)**

නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරන ලද අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා 2024-08-12 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එහෙත්, එකී පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිරීක්ෂණ ගණනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒ අනුව, මෙම පනත් කෙටුම්පතට අදාළව මූලික කෙටුම්පත සකස් කිරීම සඳහා එවකට අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුව වෙත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ යොමු කර ඇති අතර, එම කමිටුව විසින් අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත සඳහා තවදුරටත් විධිවිධාන කිහිපයක් ඇතුළත් කරමින් දැනට පිළියෙල කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සංශෝධනය කිරීම නිර්දේශ කරනු ලැබ ඇත. එකී නිර්දේශ මත පදනම්ව අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත තවදුරටත් සංශෝධනය කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුවල ඉහළ කළමනාකාරිත්වය සඳහා නිලධාරීන් පත් කිරීම**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනා අනුව පහත සඳහන් පත් කිරීම් සහ අනුයුක්ත කිරීම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

* දැනට පුරප්පාඩුව පවතින වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි එම්.කේ.ප්‍රදීප් කුමාර මහතා පත් කිරීම.

* දැනට පුරප්පාඩුව පවතින සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරනු ලබන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරී, පී.එම්.කේ.හෙට්ටිආරච්චි මහතා පූර්ණකාලීනව වැඩ බැලීම පිණිස පත් කිරීම.

* කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් දැනට සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනී එස්.එච්.ඩී.කළුතන්ත්‍රී මහත්මිය වෙනත් සුදුසු තනතුරකට පත් කිරීමට හැකි වන පරිදි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කිරීමට සහ ඒ අනුව පුරප්පාඩු වන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී විමල් එස්. කේ. ලියනගම මහතා පත් කිරීම.

* දැනට සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරේ වැඩ බලනු ලබන දේශීය ආදායම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී යූ.ඩී.එන්.ජයවීර මහතා නැවත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීමට සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයෙකු වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී යූ.එල්.උදය කුමාර පෙරේරා මහතා සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරට පත් කිරීම.

12. **රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වන බංගලා නිවාස, විසුම්පාය සහ විවිධ ප්‍රදේශයන්හි පවතින ජනාධිපති මන්දිර උපයෝජනය කිරීම පිණිස යෝග්‍ය ක්‍රමවේදයක් හඳුන්වා දීම**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ පරිපාලන බලධාරිත්වය යටතේ රජයේ බංගලා නිවාස 50ක් කොළඹ 07 සහ 05 යන ප්‍රදේශවල පිහිටා ඇත. හිටපු ජනාධිපතිවරුන්, අමාත්‍යවරුන්, නියෝජ්‍ය

අමාත්‍යවරුන් සහ විවිධ රාජ්‍ය ආයතන සඳහා මෙම බංගලා නිවාස වෙන් කිරීම සිදු කර තිබේ. එසේම, ජනාධිපති කාර්යාලයේ පරිපාලන බලධාරිත්වය යටතේ කොළඹ, මහනුවර, නුවරඑළිය, මහියංගනය, අනුරාධපුරය, කතරගම, යාපනය, ඇඹිලිපිටිය සහ බෙන්තොට යන ප්‍රදේශවල ජනාධිපති මන්දිර පිහිටා ඇත. එහෙත්, කොළඹ සහ මහනුවර ජනාධිපති මන්දිර හැර අනෙකුත් ජනාධිපති මන්දිර නිරන්තර භාවිතයට ගෙන නොමැත. ඊට අමතරව, රාජ්‍ය නායකයින් ගණනාවකගේ නිල නිවස ලෙස භාවිතයට ගත් කොළඹ 02 හි පිහිටා ඇති විසුම්පාය මේ වනවිට නාගරික සංවර්ධන අධිකාරියේ පරිපාලන බලධාරිත්වය යටතේ පවතී. එසේම, අග්‍රාමාත්‍ය කාර්යාලයේ පරිපාලන බලධාරිත්වය යටතේ නුවරඑළියේ අග්‍රාමාත්‍ය නිල නිවාසයක් පවතී. එකී රජයේ දේපළ නඩත්තුවට විශාල මුදලක් වැය කර ඇති නමුත්, එම දේපළ ඌන උපයෝජන තත්ත්වයක පවතී. එබැවින්, එම පරිශ්‍රයන් හා නිවාස ආර්ථිකමය වශයෙන් ඵලදායීව උපයෝජනය කිරීමට හැකි වන පරිදි යෝග්‍ය ක්‍රමවේදයක් යෝජනා කිරීම සඳහා නිලධාරි කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **ආර්ථික ස්ථායීකරණ හා ප්‍රතිසාධන වැඩසටහන සඳහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලේ සහාය ලබා ගැනීම**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ඇතිව ක්‍රියාත්මක කරනු ලබන විස්තීරණ අරමුදල් පහසුකම් වැඩසටහනට සමගාමීව, ශ්‍රී ලංකාවේ විස්තීරණ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය මූල්‍යනය කිරීම සඳහා අරමුදල් සපයා ගැනීම පිණිස ශ්‍රී ලංකා රජය විසින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ප්‍රතිපත්ති මත පදනම් වූ ණය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක ණය මුදලක් ලබා දීමට එම ආයතනය විසින් එකඟතාව පළ කර තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ද මෙම ණය ලබා ගැනීම, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක එම අරමුදල් වැඩසටහනේ පරාමිතීන්ට අනුකූල වන බවට තහවුරු කර ඇත. ඒ අනුව, එකී ණය මුදල ලබාගැනීම වෙනුවෙන් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල සමඟ ණය ගිවිසුමට එළඹීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. බැංකු විසින් පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමේ කාලය දීර්ඝ කිරීම**

පසුගිය වසර 04ක කාලය තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට දැඩි ලෙස බලපා ඇති අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් බැංකුවලින් ලබා ගත් ණය පියවීමේදී දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුව ඇති බව වාර්තා වී ඇත. එම තත්ත්වය යටතේ ණය පැහැර හැරීම නිසා සැලකිය යුතු ව්‍යාපාරික පිරිසකගේ දේපළ බැංකුවලට පවරාගෙන වෙන්දේසි කිරීමේ පරිසරයක් නිර්මාණය වී තිබීම හේතුවෙන් 1990 අංක 4 දරන බැංකු මඟින් ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතට සංශෝධනයක් ගෙන ඒම මඟින් දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2024-12-15 දින දක්වා තාවකාලිකව අත්හිටුවා තිබේ. පරාටේ නීතිය අත්හිටුවීම තවදුරටත් දීර්ඝ කරන ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සම්බන්ධ සංගම් මඟින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. දේපළ වෙන්දේසි කිරීමට ඉඩ දීම වෙනුවට එවැනි ණය ආපසු ගෙවීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වා දීම මඟින් දෙපාර්ශ්වයටම සාධනීය විසඳුමක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම වඩා සුදුසු බව රජය විසින් නිරීක්ෂණය කර තිබේ. ඒ අනුව, 2025-03-31 දින දක්වා පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම දීර්ඝ කිරීමටත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රාජ්‍ය හා පෞද්ගලික බැංකු සහ අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ගේ සක්‍රිය දායකත්වයෙන් මෙම ගැටලුව විසඳීමට බහුමාන යාන්ත්‍රණයක් සකස් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**15. ද්විත්ව බදුකරණය මගහැරවීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ඇති කර ගනු ලබන ගිවිසුමේ සන්ධාන පත්‍රය**

ආදායම් මත බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය මගහැරවීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු රජය අතර ගිවිසුමකට 2013 වර්ෂයේදී එළඹ ඇත. ශ්‍රී ලංකාව හා ඉන්දියාව Inclusive Framework of the Base Erosion and Profit Shifting (BEPS) Project හි සාමාජිකයන් වන බැවින්, ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානයේ 20 කණ්ඩායමේ (Group of 20 Organization for Economic Cooperation and Development) ක්‍රියාකාරී

සැලැස්මේ අවම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී. ඒ අනුව, 2013 වර්ෂයේදී අත්සන් කරනු ලැබ ඇති ද්විත්ව බදුකරණය මගහැරවීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සඳහා වන ගිවිසුම සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ සඳහා අවශ්‍ය සංශෝධන ඇතුළත්ව සකස් කරනු ලැබ ඇති සංශෝධිත ප්‍රොටකෝලය සඳහා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ එකඟතාව සහ නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, සංශෝධිත ප්‍රොටකෝලය සඳහා අත්සන් තැබීමටත්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය ප්‍රකාරව අත්සන් කරන ලද ප්‍රොටකෝලය අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **ලෝක ආහාර වැඩසටහන යටතේ මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර මෙට්‍රික්ටොන් 55,000ක් ප්‍රදානයක් වශයෙන් ශ්‍රී ලංකා රජය වෙත ලබා දීම**

ලෝක ආහාර වැඩසටහන යටතේ මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර මෙට්‍රික්ටොන් 55,000ක් ප්‍රදානයක් වශයෙන් ශ්‍රී ලංකා රජය වෙත ලබා ගැනීම සඳහා 2024-05-06 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඊට අදාළ ත්‍රෛපාර්ශ්වීය ගිවිසුම ලෝක ආහාර සංවිධානය, Uralchem - Uralkali Group සමාගම සහ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් විසින් 2024-09-20 දින අත්සන් තබා තිබේ. එකී පොහොර තොගය රැගත් නෞකාව 2024-12-10 දින මෙරටට පැමිණීමට නියමිතව ඇති අතර, පොහොර තොගය ශ්‍රී ලංකා රජය වෙත භාර දීමේ නිල උත්සවය 2024-12-12 දින කොළඹ වරායේදී සිදු කිරීමට සැලසුම් කර තිබේ. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමා ඉදිරිපත් කරන ලද එම තොරතුරු සැලකිල්ලට ගෙන, එකී මුළු පොහොර තොගයෙන් 50%ක ප්‍රමාණයක් වී හා වෙනත් භෝග සඳහාත් ඉතිරි 50% පොල් වගාව සඳහාත් භාවිත කිරීම පිණිස ගොවීන් වෙත බෙදා හැරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

***********